# Path to Success – Study Pack

## තෙවන වාරය සඳහා ඉගෙනුම් අත්වැල

# චිත්‍රකලාව
# 7 ශ්‍රේණිය



### අධ්‍යාපන සංවර්ධන අංශය

### කලාප අධ්‍යාපන කාර්යාලය - කැලණිය

**උපදේශනය හා අධීක්ෂණය**
පී.ඩී. ඉරෝෂිනී කේ. පරණගම මිය - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

**මෙහෙයවීම හා සංවිධානය**
ඒෆ්. ඒච්. ජේ. පී. සිල්වා මයා -නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ( සංවර්ධන )

**විෂය සම්බන්ධීකරණය**
අමිතා ඉන්දිරානි - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය)

**සම්පත් දායකත්වය**
එස්.එච්.පී. කාන්ති - ගුරු උපදේශක


**සියලු හිමිකම් ඇවිරිණි**

## පරිසර ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරමු

- ශ්‍රමදානයක යෙදෙන මිනිසුන් පිරිසක්
- පොරබදන සතුන් දෙදෙනෙක්

තේමාවට උචිත මානව රූප හා පරිසර ස්වභාවය වර්ණ භාවිතය ,හැගීම් ප්‍රකාශනය හා හැඩතල සමබරව ගලපා පහත දැක්වෙන ආදර්ශ නිර්මාණයන් යොදා ගනිමින් චිත්‍රයක් ඇද වර්ණ කරන්න.








## පාරිභාරික අවශ්‍යතා සඳහා නිර්මාණ කරමු


- ආදර්ශ ලියුම් රඳවනයක් සාදමු

ශීත වර්ණ හා උෂ්ණ වර්ණ හා වර්ණ ප්‍රභේද දැක්වෙන විවිධ හැඩයේ කාඩ්පත් යොදාගත් ආදර්ශ නිර්මාණ ඇසුරින් ලියුම් රඳවනයක් නිර්මාණය කරන්න. පහත පත්‍රිකාවේ ඇති උපදෙස් අනුගමනය කරන්න.



- ඔබට ලැබී ඇති හෝ සපයාගත් බෝඩ් භාවිත කර අඟල් 8X12 ප්‍රමාණයේ හා 8x8 ප්‍රමාණයේ කොටස් දෙකක් කපා ගන්න. (1 සහ 2 රූප සටහන්)
- අඟල් 12X8 කොටසෙහි අඟල් 8 පළල එක් කොටසක මුලු දෙක 3 රූප සටහනේ පරිදි සමමිතික ව වක්‍රාකාර හැඩයකට කපා ගන්න. එහිදී අඟල් 12 දිග කොටසේ දෙපැත්තේ ඉහළ සිට පහළට අඟල් 2ක උසක් ලකුණු කර ගෙන සමමිතික බව රැකෙන පරිදි වක්‍රාකාර හැඩ ඇඳ කපා ගන්න.
- එක ම වර්ණයේ ප්‍රභේද ඔබට කැමති අයුරින් භාවිත කර අඟල් 8X12 ප්‍රමාණයේ කොටස වර්ණ ගන්වන්න. (වියුක්ත හැඩ, මල් කොළ ආදී ඕනෑම හැඩයක් භාවිත කළ හැකි ය.)
- ශීත වර්ණ හා උෂ්ණ වර්ණ භාවිත කර 8X8, ප්‍රමාණයේ කොටස වර්ණ ගන්වා ගන්න.
- අඟල් 8X8 ප්‍රමාණ කොටසෙහි පිටත සිට ඇතුළට අඟලක ප්‍රමාණයක් සිටින සේ අඟල් 6x7 ප්‍රමාණයේ කොටුවක් ලකුණු කර 4 රූප සටහනේ ආකාරයට මිනුම් ලකුණු කර ගන්න. ඉන් පසුව කඩ ඉරි දිගේ නැමී යොදා අඳුරු කර ඇති සියලු කොටස් කපා ඉවත් කරන්න. (රූප සටහනේ දක්වා ඇති මිනුම පිළිබඳ සැලකිලිමත්වන්න.)
- 5 රූප සටහනට අනුව අඟල් 8X12 කොටසේ දෙපැත්තෙන් සහ පහළින් අඟලක ප්‍රමාණයක් පිටතට සිටින සේ අඟල් 6X7 ප්‍රමාණයේ කොටුවක් ලකුණු කර ගන්න.
- ලකුණු කරගත් කොටුවෙහි බාහිර රේඛාවේ තද පැහැයෙන් ලකුණු කර ඇති කොටස්වලට පිහි තලයක් ආධාරයෙන් කැපුම් යොදන්න. (නිවැරදි මිනුම් අනුව කැපුම් යෙදීමට සැලකිලිමත්වන්න.)
- අඟල් 8X8 කොටසෙහි පිටතට නෙරන සේ කපා ගත් ත්‍රිකෝණාකාර කොටස් කඩ ඉරි දිගේ වර්ණ නොකළ පැත්තට නමා, පොකැට්ටුවක් ආකාරයට නැමී යොදා සකස් කර ගන්න. (6 රූප සටහන)
- සකස් කර ගත් පොකැට්ටුව අඟල් 8X12 කොටසේ කැපුම් යෙදූ තැන්වලට ගැළපෙන සේ ඇතුළට යොදා පිට පැත්තෙන් අලවා ගන්න. (7 රූප සටහන)
- නිමකළ නිර්මාණය බිත්තියේ එල්ලා තැබිය හැකිවන සේ ඉහළ කවාකාර කොටස මැදින් සිදුරක් සාදා ගන්න. ඔබේ නිර්මාණ පන්තිකාමරයේ ප්‍රදර්ශනය කරන්න.




## ශ්‍රී ලංකාවේ ඓතිහාසික තල් කොළ නිර්මාණ අගයමු

- තල් කොළ නිර්මාණ කර්මාන්තයක් ලෙස ව්‍යාප්ත ව ඇත්තේ උතුරු නැගෙනහිර පළාත් මුල් කර ගෙන ය.
- ද්‍රවිඩ ජනතාවගේ පාරම්පරික කලා කර්මාන්තයකි.
- මඩකලපුව හා යාපනය දිස්ත්‍රික්කවල මෙම කලා කර්මාන්තය බහුල ව දැක ගත හැකි ය.
- තල් ගසෙන් ලබා ගන්නා පත්‍ර මෙම නිර්මාණ සඳහා භාවිත කරන ප්‍රධාන මාධ්‍යය වේ.
- තල් කොළ නිර්මාණ අතර පැදුරු, පෙට්ටි, කුල්ල, කඩහම්, කුට්ටාන්, බිත්ති සැරසිලි, ආභරණ හා වෙනත් විවිධ සාම්ප්‍රදායික හා නවීන නිර්මාණ දැක ගත හැකි ය.



**තල්කොළ බිත්ති සැරසිල්ලක්**



**තල්කොළ වට්ටි හා කූඩ**



**තල්කොළ විලාසිතා ආභරණ**

• තල් කොළ පැදුරු සඳහා සියඹලා ඇට රටාව, තරු රටාව, සතරැස් රටාව, මහා කෝණී ත්‍රිකෝණ  රටාව, තිත් රටාව, ජ්‍යාමිතික රටා, ගිරවා, මල්, පුසාන්දිරම් (මල් වැලි) වැනි රටා හා මෝස්තර යොදා ගනු ලැබේ.
• නිර්මාණ සඳහා භාවිත කරන තල් කොළ වර්ණ ගැන්වීමේ දී සාම්ප්‍රදායික ක්‍රමයට ජලයට වර්ණ  මිශ්‍ර කර තල් කොළ දමා තම්බා ගැනීමෙන් පසු වියළා ගනු ලබයි .

## ශ්‍රී ලංකාවේ පන් හා නියඳ කර්මාන්ත ආශ්‍රිත කලා නිර්මාණ අගයමු


- පැදුරු කර්මාන්තය සිංහල සංස්කෘතියට අවේනික ගැමි කලා කර්මාන්තයකි.
- නියඳ පැදුරු නිර්මාණය අතීතයේ සිට පැවත එන ගැමි කලා කර්මාන්තයකි.
- දුම්බර ප්‍රදේශය මේ සඳහා ප්‍රසිද්ධියක් උසුලන බැවින් දුම්බර පැදුරු ලෙස ද මෙම නිර්මාණ හඳුන්වයි.
- නියඳ වර්ණ ගැන්වීම සඳහා පතඟි, ගොරකා කොළ, වෙනිවැල් ගැට, අමු කහ, කණේරු, ලූණුමිදෙල්ල කොළ, කොහොඹ, අරළු , බුළු වැනි ද්‍රව්‍ය භාවිත කරයි.
- නියඳ පැදුරු නිෂ්පාදනය නියඳ කෙඳි සහ හණ කෙඳි මාධ්‍ය ලෙස භාවිත කරයි.



**හන පත්‍රවලින් කෙඳි ලබා ගැනීම**




**හන කෙඳිවලින් කලාල විවීම**



පන් පැදුරු විවීම

• නියඳ කළාල ප්‍රධාන කොටස් 03කින් සමන්විත වන අතර පන්නම් කළාල, වැඩ කළාල, කුරුළු කළාල යනුවෙන් නම් කර ඇත.
• නියඳ කෙඳි හා හණ කෙඳි භාවිතා කර සරල උපකරණයක් භාවිතයෙන් කළාල නිර්මාණය කරයි.
• නියඳ කලාව සඳහා තොරන් පෙත්ත, රත්වත්තේ අලංකාරයට, කුරුළු, නාග, ඇත්, සත්ව රූප  මෙන්ම තනිවැල් ඉරුව, දෙපොට ලණුව වැනි මෝස්තර යොදනු ලබයි.





• පන් පැදුරු කර්මාන්තයේදී පන් වර්ග භාවිතාකොට අතින් වියා පැදුරු නිර්මාණය කරයි.
• පන් පැදුරු කර්මාන්තයේ නියැලෙන ශිල්පීන් 'කින්නරයින්' ලෙස හඳුන්වයි.
• දකුණු කළුතර, ගාල්ල, ගම්පහ, රත්නපුර යන දිස්ත්‍රික්කවල සුළු වශයෙන් මෙම කර්මාන්තය සිදු කරයි.
• දකුණේ පන් පැදුරු රටා අතර තාරකා පෙත්ත, සත්ත්ව සැරසිලි ආදිය දැක ගත හැකි ය.



**කදුරු මල්**



**නයි පොරය රටාව**



**වංක ගිරිය රටාව**



ජ්‍යාමිතික රටා


• මඩකලපුව දිස්ත්‍රික්කයේ වාලච්චේනෙයි, හල්ලාරු, කාත්තන්කුඩි, ඒරාවූර් ආදි ගම්මාන පන් පැදුරු කලාවට ප්‍රසිද්ධ ය.
• ඔන්ඩිප්පායි (සමචතුරස්‍රයක්, සෘජුකෝණාස්‍රයක්, ත්‍රිකෝණය, වැනි ජ්‍යාමිතික හැඩතල), පුනිප්පායි (සමාන්තර රටා) යනුවෙන් ප්‍රධාන රටා දෙවර්ගයකි. මෙම දෙවර්ගයේ රටා යොදාගෙන විවිධ රටා ගණනාවක් යොදා පැදුරු නිර්මාණය කරයි.


| | **තල් කොළ නිර්මාණ** | **පන් කර්මාන්ත ආශ්‍රිත කලා නිර්මාණ** | **නියඳ කර්මාන්ත ආශ්‍රිත කලා නිර්මාණ** |
|---|---|---|---|
| ප්‍රචලිත ප්‍රදේශ | | | |
| කරන නිර්මාණ | | | |
| වර්ණ සකස්කර ගන්නා ආකාරය | | | |
| භාවිතා කරන රටා | | | |
| මාධ්‍ය | | | |

පහත වචනවල අර්ථය දැක්වෙන සේ වැකියක් ලියන්න.
කින්නරයන් - .............................................................................................................
කුරුළු කලාල - ..........................................................................................................
තාරකා පෙත්ත - ...........................................................................................................

## සරල ජ්‍යාමිතික හැඩගත් වස්තු සහ ශාක කොටස් ඇද වර්ණ ගන්වමු

බෝතලයක්, ලොකු පොතක් සහ බෝලයක් ඇද වර්ණ ගන්වමු
මූලික සරල හැඩ පරිමානුකුලව හා ගතිලක්ෂණ මතුවන සේ පහත සඳහන් ආදර්ශ උපයෝගී කරගෙන ද්‍රව්‍ය සම්පිණ්ඩනය කරන්න



















## උද්භිත ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර

. උද්භිත ගණයට අයත් සැරසිලි හඳුනාගනිමු.

• වෘක්ෂලතා, පුෂ්ප මූලික කර ගනිමින් නිර්මාණශීලී ව සිත්තම් කළ මෝස්තර ඒකක උද්භිද මෝස්තර ලෙස නම් කර ඇත.

• ස්වාභාවික හා කල්පිත හැඩ සහිත ව උද්භිද මෝස්තර හඳුනාගත හැකි ය. ස්වාභාවික උද්භිද මෝස්තර ඒකක - සපුමල, වැටකේ මල, මානෙල් මල

• කල්පිත උද්භිද මෝස්තර ඒකක - කඩුපුල් මල, සීන මල, පරසතු මල, කතිර මල,

• මෙම නිර්මාණ විහාර බිතු සිතුවම් මෙන් ම ගල් කැටයම් හා ලී කැටයම් හා වෙනත් විවිධ කර්මාන්තවල සැරසිලි අංග ලෙස භාවිත කර ඇත.

• තනි මලේ මෝස්තර ඒකක මෙන් ම නෙළුම් මලේ පෙති නිර්මාණාත්මක ව යොදා ගනිමින් පලා පෙති මෝස්තර රාශියක් ද නිර්මාණය කර ඇත.


• වාටියක් හෝ අයිනක් සැරසිලි කිරීම සඳහා පලාපෙති යොදා ගන්නා අතර යොදන ස්ථානය හෝ භාණ්ඩයේ හැඩය අනුව සැරසිලි ඒකකය උචිත ලෙස සකස් කර ගනී.

• වෘක්ෂවල මල්, කොළ, ගැට, කරු, ආධාර කර ගනිමින් විවිධ ලියවැල් මෝස්තර නිර්මාණය කර ඇත.

• තනිවැල, වැල් දෙක, සරල ව මෙන් ම සංකීර්ණ ව ද ලියවැල් මෝස්තර ගණනාවක් ද හඳුනාගත හැකි ය.



*සීන මල*



*පලාපෙති*




*අන්නාසි මල*




**සපු මල**



**වැටකේ මල**



**කඩුපුල් මල**




**පිච්ච මල**



**බිනර මල**



**කතිර මල**



ලියවැල



නෙළුම් මල්

- උද්භිත ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර නමින් කුඩා පොත් පිංචක් නිර්මාණය කරන්න
- උද්භිත ගණයට අයත් සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර යොදා ගනිමින් මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න

## විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරමු

**සත්ව හෝ මානව රුවක් නිර්මාණය කරමු.**

- එකලස් කිරීමේ ක්‍රමයකට අනුව නිර්මාණය කල හැකි සත්ව රූපයක හෝ මානව රූපයක දළ සටහනක් ඇද ගන්න.
- ඉවතලන ප්ලාස්ටික් /ටින් / පෑන් බට/ ප්ලාස්ටික් බට/ යකඩ/ ඇලුමිනියම්/ තඹ / පිත්තල තහඩු/ ලෑලි කැබලි/කම්බි ඇණ/ බොත්තම් වැනි දේ තෝරාගන්න.
- ඇද ගත් දළ සටහනට අනුව ද්‍රව්‍ය එකලස් කරමින් අවශ්‍ය හැඩය මතු කරගන්න.
- බැඳීම, ඇලවීම, ප්ලාස්ටික් වැනිදේ පුළුස්සා රත්කර ඇලවීම, ඇමිණීම වැනි ක්‍රම භාවිතා කළ හැකිය.
- උචිත වර්ණ යොදා අලංකාර කර ගන්න.
- **මෙය එකලස් කිරීමේ ශිල්ප ක්‍රමයයි.**

